# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2001 අංක 11 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2001 සැප්තැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 සැප්තැම්බර් මස 28 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. **4.25** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

**2001 අංක 11 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2001 සැප්තැම්බර් මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 31/98.

**විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2001 අංක 11 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 34 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත්කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 112 වන අධිකාරයේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

> "(2) විවාහයක් චාරිත්‍රානුකූලව සිදුකිරීමෙන් ඉක්බිතිව ම, පළමුවන උපලේඛනයේ 'ඕ' ආකෘතියෙහි, විවාහය පිළිබඳ විස්තර ප්‍රකාශයක්, ඒ කාර්යය සඳහා තිබිය යුතු පොතක පිටපත් තුනකින් යුතුව දේවගැතිවරයා විසින් ඇතුළත් කරනු ලැබිය යුතු ය. එබඳු සෑම සටහනකම අනුපිළිවෙලින් අංක යෙදිය යුතු ය. දේවගැතිවරයා විසින්, එම ප්‍රකාශයේ තුන්වන පිටපත අයකිරීමකින් තොරව පාර්ශ්වකරුවන්ට නිකුත් කරනු ලැබිය යුතු අතර, එම පිටපත, එම දේවගැතිවරයා අයත් වන්නා වූ දේවස්ථානයේ, නිකායේ හෝ මණ්ඩලයේ රීති, චාරිත්‍ර විධි සහ පූජා විධිවලට අනුව, එම විවාහය චාරිත්‍රානුකූලව සිදුකිරීම පිළිබඳව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.".

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2–H 011687–4,400 (2001/05)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.